# සිංහල



## 2 ශ්‍රේණිය

Start Your Learning Journey with e-thaksalawa
The National e-learning Portal for The General Education

# 3.අකුරු හඳුනා ගනිමු. ලියමු. කියවමු.

මෙම ක්‍රියාකාරකම තුළින් බලාපොරොත්තු වන්නේ ඔබේ දරුවා සම්මත භාෂා ව්‍යවහාර භාවිත කිරීම හා භාෂා අභ්‍යාසයේ යෙදීම පිළිබඳ ව හැකියා වර්ධනය කිරීමයි.

## ක්‍රියාකාරකම 1

### පියවර 1

- පහත සඳහන් වචන ලැයිස්තුව ශබ්ද නඟා කියවන ලෙස දරුවාට කියන්න.

| | |
|---|---|
| කඩය | කුඩය |
| කාලය | කූඩුව |
| කැටය | කෙසෙල් |
| කෑරලා | කේතලය |
| කියත | කොළඹ |
| කීර්ති | කෝටුව |

**කාඩ්පත් අංක 1**

| | |
|---|---|
| පහන | පුටුව |
| පාලම | පූසා |
| පැදුර | පෙරහැර |
| පෑන | පේර |
| පිහිය | පොත |
| පීරිසිය | පෝරුව |

**කාඩ්පත් අංක 2**

### පියවර 2

- අංක (1) කාඩ්පතේ ඔබ පවසන අකුරින් පටන් ගන්නා වචනය පෙන්වීමට දරුවාට කියන්න.

උදා: කැ අකුර කියූ විට කැටය

කු අකුර කියූ විට කුඩය

### පියවර 3

- කියවන ලද වචන කිහිපයක් අසා ලිවීමට දෙන්න.

## පියවර 4

- අංක (2) කාඩ්පතේ වචන ඉහත ආකාරයට සෙවීමට යොමු කිරීමට හා අනෙකුත් අකුරුවල ද මෙවැනි වචන ලැයිස්තු කාඩ්පත් සාදා අකුරු හඳුනා ගැනීමට යොමු කරන්න.